# අහසයි ඔබ මට






කාලෙකට ඉස්සර "සිංග්ලංකා" සමාගමෙන් ආධුනික ගීත තරඟයක් සංවිධානය කළා. ප්‍රසිද්ධ ගීතවල සංගීත පථ ඇතුලත් සංගත තැටියක් "ගයන්න ගී" නමින් එළිදක්වලා ඒ අනුව ගායනා කරන ආධුනිකයින්ගෙන් හොඳ අයව තෝරන එකයි කළේ. මේ තරඟයෙන් දිනපු පාසැල් දැරිවියක් අපට අද වගේ මතකයි. ඇය මුලින්ම ඇන්දෙ පාසැල් නිල ඇඳුම කොන්ඩය ලතාවකට ඉහළට බැඳලා තිබුණා. මේ තමයි දීපිකා ප්‍රියදර්ශනී කියන ප්‍රවීණ ගායන ශිල්පිනිය අපේ මතකයට මුලින්ම එක් වුණ විදිය. විශාරද විභාග සමත් වෙන්න කලින් ම ඇයගේ හඬ අපේ මතකයට එක් වුණේ "ආපු තපර ලායිලා" යුග ගීතයෙන්. තරඟයෙන් දිනපු ඇයට අළුත් ගීතයක් ගයන්න ඉඩ ලැබුණා. ඒ "සිනා පොදක් වී" ගීතය. පස්සෙ කාලෙක ඇය ලංකාවේ ජනප්‍රියම ගායිකාව විදියට කීප වතාවක් ම තේරුණා. ලංකාවේ වගේම ජාත්‍යන්තර සම්මාන පවා ලබපු ඇය අපගේ ගී සඳළුවට කැඳවන්න අප හිතුවා.

ජූනි 20 වෙනිදට ලබන සුභ මොහොතින් දීපිකා බොරලැස්ගමුවේ අබේරත්න මාවතේ හදපු නව නිවහනට යන්න ලහි ලහියේ ලක ලෑස්ති වෙන අතරෙයි ඇයට අප කතා කළේ.

උපන් දා ඉඳන් උන්නු තැනින් වෙන තැනකට යනකොට මොන තරම්නම් දේවල් තියෙනවද අළුත් තැනට ගෙනියන්න....." ඇය අප හා සුහද පිළිසඳරට එක් වුණේ එහෙමයි.

"අපි මොනවද අද කතා කරන්නෙ ? "අහසයි ඔබ මට" සින්දුව ??"

"ඒක හොඳයි !" ඇය එකඟ වුණා.

"මම මේ ක්ෂේත්‍රයට අඩිය තියනකොටම වගේ කරපු ගීත හතරෙන් එකක් ඔය සින්දුව. "ආපු තපර ලායිලා", "සිනා පොදක් වී" වගේ ගීත කළාට පස්සේ අපි ම වියදම් කරලා ගීත හතරක් කරන්න හිතුවා. ඒ සින්දු හතර තමයි, " මා සිතට අහම්බෙන්", "මගේ කඳුළු වැල්", " නංගියේ මොකද ?", "අහසයි ඔබ මට" කියන හතර. ඒ අතර තිබුණ එකම යුග ගීතය තමයි " අහසයි ඔබ මට".

"ඉතින් මේ සින්දුවේ යුග ගායනයට යෝජනා වුනේ සුනිල් අයියා. ඇත්තටම සුනිල් අයියා මා එක්ක යුග ගායනයකට කැමති වුණ එක ම ලොකු දෙයක්. මං වාගේ ඉස්කෝලේ ළමයෙකුට එදා සුනිල් අයියව පෙනුනෙත් අහසක් වගේ. ළං වෙන්න බැරි තරමට ඉහළ". දීපිකා මේ කතා කරන්නේ ප්‍රවීන ගායන ශිල්පී සුන් එදිරිසිංහයන් ගැන.

"මේ ගීතය ලිව්වේ බන්දුල නානායක්කාර-වසම් අයියා. රෝහණ අයියා තමයි සංගීතය කළේ. ඇත්තට ම මේ අය එදා වැඩ කළේ මුදල් ගැන නොහිතා. හොඳ දරු පිරිසක් බිහි කරන අදහසින්ම වැඩ කරපු නිසා තමයි අද රෝහණ අයියලා ගරු බුහුමන් ලබන්නේ. "ආචාර්ය රෝහණ වීරසිංහයන් දීපිකාට මුල ඉඳන්ම අත දුන් අයගෙන් කෙනෙක්. ඇත්තට ම දීපිකාට ඔහු සංගීත ක්ෂේත්‍රයේ පියෙක් වගේ.

"මේ ගීත පටිගත කරන්න යොදාගෙන තිබුණේ නුගේගොඩ නිලූ ශබ්දාගාරයේ. ඉතින් අම්මා මට කිව්වා කලින් ගිහින් අත්තිකාරම් මුදල් බැඳලා එන්න කියලා. රුපියල් දෙදාහකුත් දුන්නා. අනේ සිසිර, ශබ්දාගාරයට ගිහින් බලන කොට මගේ පසුම්බිය කපලා. සල්ලි හොරු අරගෙන, කළුබෝවිල ඉඳන් නුගේගොඩට බස් එකේ එන ඩිංගට. මම ඉතින් මර්වින් බෙන්ස් මහත්තයට ඔය වග කියලා ආපහු ආවා." ඒ දීපිකාට වුණු ඇබැද්දියක මතකය. ඇබැද්දියක් වුණත් අද සොඳුරු මතකයක්.

"සුනිල් අයියාට වැඩිය යුග ගීත නෑ. තියෙන යුග ගී අතරින් රසිකයින් වැළඳගත්ත හොඳ ගීතයක් "අහසයි ඔබ මට". ඒ වගේම "සුනිල් " කියන අහසින් මට ලැබුණු ආලෝකය හරි වටිනවා. ඒ වගේම කුලේ අයියගෙන් ලැබුණ ගුරුහරුකම් ගැනත් මතක් කරන්න ම ඕන". දීපිකා ඒ සිහිපත් කළේ කුලරත්න ආරියවංශ ප්‍රවීණ ගීත නිබන්ධකයාව. ඔහුට අදරේට හැමෝම කියන්නේ "කුලේ අයියා" කියලා. ඉතින් අපි දීපිකා ප්‍රියදර්ශනීට ස්තූති කරලා සමුදුන්නා.

මේ ගීතයේ යුග ගායනයට දායක වුණ සුනිල් එදිරිසිංහ ප්‍රවීණ ගායන ශිල්පියානන්වත් දුරකථනයෙන් සම්බන්ධ කරගන්නට උත්සාහ කළා. එංගලන්තයේ වාසය කරන තමන්ගේ එකම පුතාට දාව ඉපදුන තමන්ගේ කුළුඳුල් මුණුපුරා දැක බලාගන්නට ගිහින් හිටට එදිරිසිංහයන්ව අපට අන්තිමේදී සම්බන්ධ කරගන්න ඉඩ ලැබුණා.

"ඔව් සිසිර, හරිම සතුටුයි මටයි බිරිඳටයි. මොකද අපේ පුතාට ඕන කරලා තිබුණා එයාගේ දරුවා උපන් ගමන් මුලින්ම අපේ අතට වඩාගන්න දෙන්න. ඉතින් දරුවා උපදින වෙලාවේ අපි එහේ. ඉතින් අපේ පුතාගේ ආශාව ඉෂ්ඨ වුණා. ඒ වගේම ඒක අපෙත් ආසාවනේ. මම දැන් සීයා කෙනෙක් !." එදිරිසිංහයන්ගේ කට හඬ හැඟුම් බරයි.

"ඉතින් අහසයි ඔබ මට ගීතය ගැන කතා කලොත් මට කියන්න තියෙන්නේ මම ඉතාම සතුටින් ගායනා කරපු ගීතයක් කියලයි. මොකද මම දැනගෙන හිටියා දීපිකා පාසල් යන කාලයේ ඉඳන් ම හොඳට ගායනා කරන දැරියක් බව. අපට පසු කාලයක ක්ෂේත්‍රයට සම්බන්ධ වෙන කාලයේ ඇය මට මේ ගීතය ගායනා කරන්න කරපු ආරාධනාව මම භාරගත්තේ හරිම සතුටින්. ඒ වගේම මේ ගීතය ජනතාව අතරට ගිය ගීතයක්."

එංගලන්තයේ සිට ආපු ඇවිත් අවිවේකයෙන් ඉන්න වෙලාවක සුනිල් එදිරිසිංහයන් අප සමඟ ටික වෙලාවක් වෙනත් අල්ලාප සල්ලාපයේ ද යෙදෙන්නට අමතක කළේ නෑ. එදිරිසිංහයන්ටත් ගී සඳළුව වෙනුවෙන් ස්තූතිවන්ත වෙමින් සමුදුන්නා.

| | |
|---|---|
| ගැහැණු: | අහසයි ඔබ මට නිම් හිම් නො පෙනෙන<br>ඉණි මං බඳිනු බැරී |
| පිරිමි: | පොළවයි ඔබ මට තරුවක් විලසට<br>රෑ කල පතිත වෙමී |
| ගැහැණු: | ගඟෙ වතුර නැහැ ඉහළට ගලා ගියේ<br>අකුණු හඬින් නැහැ කඳු බිම් සසල වුණේ |
| පිරිමි: | ගඟ කවදා හෝ මුව දොර හමුවෙනවා<br>ලොව කැළඹුන දා කඳු බිම් හැකිලෙනවා |
| ගැහැණු: | අනාත සයුරට වැසි දිය දෝත ඔබයි<br>අගාධ අඳුරක දුර රන් සළුව ඔබයි |
| පිරිමි: | ඔබ මට ළඟ ඉඳුරා මම දනිමි<br>ඔබ වට කහවනු පවුරක මහ දුරකී |
| **ගායනය:** | **සුනිල් එදිරිසිංහ, විශාරද දීපිකා ප්‍රියදර්ශනී** |
| **සංගීතය:** | **ආචාර්ය රෝහණ වීරසිංහ** |
| **රචනය:** | **බන්ධුල නානායක්කාරවසම්** |

## OFF THE RECORD




**''සම්මුඛ සාකච්ඡාවක් ලබාදීම ගැන ස්තූතියි මහ රජාණෙනි, ඕෆ් ද රෙකෝඩ් ප්‍රශ්ණ කීපයක් අහන්න අවසරද?''**
''අර මක්ක ගැනයි''

**''රජකම ලැබෙන කං තමන්ගේ රටේ පත්තර කන්තෝරු ගානේ රිංග රිංගා බලෙන්ම වගේ ඉන්ටවීව් දුන්න ඔබතුමා රජ වුණාට පස්සේ විදෙස් මාධ්‍යවලට විතරක් ඉන්ටවීව් දෙන්නේ ඇයි?''**
''අපේ උන්ට අහවල් ඉන්ටවීව්ද අයිසේ? මම කියන්න ඕනේ දේවල් මට වැඩිය හොදට උන්ම ලියනවානේ. මම ඉතිං උන්ට ටොපියක් ලොසින්ජයක් දෙනවා. එච්චරයි''

**''යුද්දෙ දිනුවයින් පස්සේ ලෝක ප්‍රකට ප්‍රතාපවත් මහා රාජ කෙනෙක් බවට පත්වුණ ඔබවහන්සේ ලෝකයේ මහ බලවත් රටවල්වල සංචාරය කරනවට වඩා අහුමුළුවල තියන කොදෙව් රටවල්වලම කරක්ගහන්ඩ වැඩි කැමැත්තක් දක්වන්නේ ඇයි?''**
''මගේ රජ වැඩ කිඩ නිසා ඕකුං කවුරුවත් වැරදිලාවත් මට ආරාධනා කරන්නේ නෑනේ අයිසේ උන්ගේ රටවල්වලට. මම එන්ඩ ඇහුවත් එපා කියනවා. බලෙන්ම වගේ ගියොත් ඩයස්පෝරාව දාලා හූවක් හරි කියවනවා. යන එන මං නැතිවුණාම යන තැන්වල තමයි දැන් මම යන්නේ''

**''13 ජ්ලස් දෙනව කිය කියා කෙකෙර ගගා ඉඳලා දැන් මොකද මේ එකපාරම ඉඩම් බලතල බෑ, පොලිස් බලතල බෑ කියලා වෙනත් තැටියක් වාදනය කරන්නේ?''**
''ජේ.ආර්.ටත් වැඩිය සැර ඒකාධිපති ව්‍යවස්ථාවක් හැදුව මම එහෙමත් බලය බෙදනවද අයිසේ. අනික අයිසේ තමුසේ මාධ්‍යවේදියෙක්වෙලත් දන්නේ නැත්ද මම කට ඇරියොත් කෙලින්නේ කෙප්ප කියලා?''

**''රටේ නිත්‍යානුකූල පොලිසියක් තියෙද්දි සිවුරු අදින නිල නොවන පොලිසියක් පිහි-ටුවලා තියෙන්නේ ඇයි?''**
''පොලිසියෙන් කරව ගන්න පුළුවන් හැම පක්කලි වැඩක්ම මම ගන්නවා තමයි. ඒ වුණාට උන්ට කියලා ජාතිවාදය අවුස්සවන්න බෑනේ. ඒකයි ඒ''

**''හරක් මරන එක තහනම් කරන්න කියලා දැන් රටේ මහ ගෝෂාවක් තියනවා නේද? ඒකට මොකද කරන්නේ?''**
''හැකිතරම් ඉක්මනින් ඒක නම් තහනම් කරන්ඩම ඕනේ පුතෝ. නැත්නම් ඊළඟ මැතිවරණයෙන් මට යන මං නැතිවෙනවා සිකුරුයි''
**''සහතික ඇත්ත මහරජාණෙනි, සහතික ඇත්ත''**

**ම.රා. සාද්**

